# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල



තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1786/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024 තිස

දිනය / Date — 01/12/2024 පැය 1135

## මාධ්‍ය නිවේදනය

### 01. මනුෂ්‍ය ඝාතනයක් - කතරගම පොලිස් වසම.

2024.11.30 වන දින සවස් කාලයේදී කතරගම පොලිස් වසමේ සෙල්ලකතරගම කොහොඹදිගාන ප්‍රදේශයේදී පුද්ගලයෙකු තියුණු ආයුධයකින් පහර දී ඝාතනය කර ඇති බවට කතරගම පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 39 ක් වූ සෙල්ල කතරගම ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මරණකරු සිය හිතවතෙකුගේ නිවසේ රැඳී සිටියදී එම නිවසේ හිමිකරු සමඟ ආරවුලක් ඇති කරගත් පිරිසක් ඔහුට පහරදීමට පැමිණ ඇත. එම ගැටුම විසඳීමට මරණකරු මැදිහත්වීමේදී එම පිරිස විසින් තියුණු ආයුධ වලින් ඔහුට පහරදී මෙම ඝාතනය සිදුකර ඇති බවට විමර්ශන වලදී අනාවරණය වී ඇති අතර සැකකරුවන් ඝාතනයෙන් පසු ප්‍රදේශයෙන් පලාගොස් ඇත. සැකකරුවන් හඳුනාගෙන ඇති අතර ඔවුන් අත්අඩංගුවට ගැනීම සඳහා කතරගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කළුතර අපරාධ කොට්ඨාසය.

2024.11.30 වන දින සවස් කාලයේ පානදුර පොලිස් වසමේ පානදුර නගරයේදී කළුතර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 52 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන අළුබෝමුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කළුතර අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 03. මාරක රිය අනතුරක් - පොල්ගහවෙල පොලිස් වසම.

2024.11.30 වන දින සවස් කාලයේ පොල්ගහවෙල පොලිස් වසමේ කොළඹ කුරුණෑගල ප්‍රධාන මාර්ගයේ හොදැල්ල ප්‍රදේශයේදී කොළඹ දෙසට සිට කුරුණෑගල දෙසට ධාවනය වූ බස් රථයක් පදික මාරුවක් මතින් මාර්ගය හරහා

ගමන් කල පදික පුද්ගලයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදිකයා පොල්ගහවෙල රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 68 ක් වූ මැටිකුඹුර, පොල්ගහවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පොල්ගහවෙල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. අනතුර සම්බන්ධයෙන් පොල්ගහවෙල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**